# අ.පො.ස. (උසස් පෙළ)

# ආර්ථික විද්‍යාව



# නිෂ්පාදන සාධක

## ප්‍රශ්න සහ පිළිතුරු

**නිපුණතාවය 1.3 : නිෂ්පාදන සාධක වල ලක්ෂණ හඳුනා ගනිමින් නිෂ්පාදන සම්පත් වල ඵලදායීතාවය තීරණය කරන සාධක විග්‍රහ කරයි.**

## ප්‍රශ්න අංක 01

භාණ්ඩ හා සේවා නිශ්පාදනයට යොදා ගන්නා නිශ්පාදන සාධක වර්ග කවරේද?

පිළිතුර :-

1. භූමිය
2. ශ්‍රමය
3. ප්‍රාග්ධනය
4. ව්‍යවසායකත්වය

## ප්‍රශ්න අංක 02

භූමිය යන නිෂ්පාදන සාධකය සඳහා නිදසුන් කිහිපයක් සපයන්න.

පිළිතුර :-

- ✓ වනාන්තර
- ✓ පස
- ✓ දේශගුණය
- ✓ ගංගා
- ✓ දිය ඇලි
- ✓ ඛණිජ සම්පත්
- ✓ මත්ස්‍ය සම්පත්
- ✓ වන සතුන්

## ප්‍රශ්න අංක 03

නිශ්පාදන සාධකයක් වශයෙන් භූමිය යනුවෙන් කුමක් අදහස්වේ ද?

පිළිතුර :-

ස්වභාව ධර්මයා විසින් දායාද කොට ඇති නිෂපාදනයට යොදා ගත හැකි ඵලදායීතාවයකින් යුක්ත සියළුම ස්වාභාවික සම්පත් භූමිය නමින් හැඳින්වේ.



The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

**නිපුණතාවය 1.3 : නිෂ්පාදන සාධක වල ලක්ෂණ හඳුනා ගනිමින් නිෂ්පාදන සම්පත් වල ඵලදායීතාවය තීරණය කරන සාධක විග්‍රහ කරයි.**

## ප්‍රශ්න අංක 04

භූමිය යන නිශ්පාදන සාධකයෙහි පවතින විශේෂිත ලක්ෂණ කවරේද?

පිළිතුර :-

- ✓ ස්වභාවික සාධකයක් වීම.
- ✓ සංචලතාවය පිළිබඳ සීමා පැවතීම.
- ✓ සැපයුම අනන්‍ය වීම.
- ✓ ඵලදායීතාවය වර්ධනය කළ හැකිය.
- ✓ භූමියට කරන ගෙවීම බදු කුලිය වීම.

## ප්‍රශ්න අංක 05

ශ්‍රම සාධනය සඳහා නිදසුන් කිහිපයක් ඉදිරිපත් කරන්න.

පිළිතුර :-

ගොවියෙක්



වෛද්‍යවරයෙක්



## ප්‍රශ්න අංක 06

නිශ්පාදන සාධකයක් වශයෙන් ශ්‍රමය යනුවෙන් කුමක් අදහස්වේ ද?

පිළිතුර :-

භාණ්ඩ හා සේවා නිශ්පාදනය සඳහා යොදාගැනෙන කායික හා මානසික ප්‍රයත්නය ශ්‍රමය නමින් හැඳින්වේ.



Copyright © e-thaksalawa.moe.gov.lk

**නිපුණතාවය 1.3 : නිෂ්පාදන සාධක වල ලක්ෂණ හඳුනා ගනිමින් නිෂ්පාදන සම්පත් වල ඵලදායීතාවය තීරණය කරන සාධක විග්‍රහ කරයි.**

## ප්‍රශ්න අංක 07

ශ්‍රම සාධනයෙහි පවතින විශේෂිත ලක්ෂණ කවරේද?

පිළිතුර :-

- ✓ සජීවී නිෂ්පාදන සාධකයක් වීම.
- ✓ සංචලනය කල හැකි වීම.
- ✓ සමජාතීම නොවීම.
- ✓ ශ්‍රමයේ ඵලදායීතාවය වර්ධනය කල හැකි වීම.
- ✓ ශ්‍රමය පුද්ගලයාගෙන් වෙන් කර ගත නොහැකි වීම.
- ✓ ශ්‍රමයට කරන ගෙවීම වැටුප් වීම.

## ප්‍රශ්න අංක 08

ප්‍රාග්ධනය සඳහා නිදසුන් කිහිපයක් ඉදිරිපත් කරන්න.

පිළිතුර :-

- ✓ වික්ටෝරියා ජලාසය
- ✓ මිරිදිය මත්ස්‍ය පොකුණක්
- ✓ කුඹුරක්
- ✓ ට්‍රැක්ටරයක්
- ✓ ආරෝග්‍ය ශාලාවක්

## ප්‍රශ්න අංක 09

ප්‍රාග්ධනය යනුවෙන් කුමක් අදහස් වේ ද?

පිළිතුර :-

නිශ්පාදන ක්‍රියාවලියට යොදාගනු ලබන, මිනිසා විසින් නිර්මාණය කරන ලද ආධාරක ප්‍රාග්ධනය නමින් හැඳින්වේ.


Copyright © e-thaksalawa.moe.gov.lk

**නිපුණතාවය 1.3 : නිෂ්පාදන සාධක වල ලක්ෂණ හඳුනා ගනිමින් නිෂ්පාදන සම්පත් වල ඵලදායීතාවය තීරණය කරන සාධක විග්‍රහ කරයි.**

## ප්‍රශ්න අංක 10

ප්‍රාග්ධන සාධනයෙහි මූලික ලක්ෂණ කවරේද?

පිළිතුර :-

- ✓ මිනිසා විසින් නිර්මාණය කරන ලද්දක් වීම.
- ✓ නිෂ්පාදන ආධාරකයක් වීම.
- ✓ මූර්ත සංකල්පයක් වීම.
- ✓ තොග සංකල්පයක් වීම.
- ✓ ඵලදායීතාවයෙන් යුක්ත වීම.
- ✓ නැවත නැවත භාවිත කළ හැකි වීම.
- ✓ භාවිතයත් සමඟ ක්ෂය වීමකට ලක්වීම.
- ✓ ප්‍රාග්ධනයේ ප්‍රතිලාභ පොලිය වීම.

## ප්‍රශ්න අංක 11

ප්‍රාග්ධනයෙහි විවිධ ස්වරූපයන් නම් කරන්න.

පිළිතුර :-

- ✓ ස්ථාවර ප්‍රග්ධනය (පූර්ණ/ භෞතික)
- ✓ සංසරණ ප්‍රාග්ධනය (කාරක ප්‍රාග්ධනය)
- ✓ ආර්ථික පොදු කාර්ය ප්‍රාග්ධනය
- ✓ සමාජ පොදු කාර්ය ප්‍රාග්ධනය
- ✓ සමාජ ප්‍රාග්ධනය
- ✓ මානව ප්‍රාග්ධනය
- ✓ ස්වාභාවික ප්‍රාග්ධනය


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

නිපුණතාවය 1.3 : නිෂ්පාදන සාධක වල ලක්ෂණ හඳුනා ගනිමින් නිෂ්පාදන සම්පත් වල ඵලදායීතාවය තීරණය කරන සාධක විග්‍රහ කරයි.

## ප්‍රශ්න අංක 12

"ප්‍රාග්ධනය බිහි කිරීම සඳහා ආයෝජනය ඉතා වැදගත්ය." ප්‍රාග්ධනය සහ ආයෝජනය අතර වෙනස දක්වන්න.

පිළිතුර :-

| ප්‍රාග්ධනය | ආයෝජනය |
|---|---|
| • නිෂ්පාදන ක්‍රියාවලියට යොදාගනු ලබන, මිනිසා විසින් නිර්මාණය කරන ලද නිෂ්පාදන ආධාරක ප්‍රාග්ධනය වේ. | • ප්‍රාග්ධන භාණ්ඩ බිහි කිරීමට අරමුදල් යෙදවීමේ ක්‍රියාවලි ආයෝජනය හෝ ප්‍රාග්ධන සම්පාදනය වේ. |
| • ප්‍රාග්ධනය තොග සංකල්පයකි. | • ආයෝජනය ප්‍රවාහ සංකල්පයකි. |
| • ප්‍රාග්ධනය ක්ෂය වීමට ලක්වේ. | • ආයෝජනය තුලින් ක්ෂය වන ප්‍රාග්ධනය සම්පාදනය කළ හැකිය. (අළුතින් බිහි කිරීම හෝ ප්‍රතිසංස්කරණය) |
| • ප්‍රාග්ධනය ආයෝජනයෙන් බිහි වේ. | • ආයෝජන සඳහා අරමුදල් ලැබෙන්නේ ඉතිරිකිරීම් වලිනි. |



The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk


**නිපුණතාවය 1.3 : නිෂ්පාදන සාධක වල ලක්ෂණ හඳුනා ගනිමින් නිෂ්පාදන සම්පත් වල ඵලදායීතාවය තීරණය කරන සාධක විග්‍රහ කරයි.**

## ප්‍රශ්න අංක 13

ඉතිරිකිරීම්, ආයෝජන සහ ප්‍රාග්ධනය අතර පවතින සම්බන්ධය කෙබඳු වේද?

පිළිතුර :-

ඉතිරිකිරීම් වැඩිවන විට ආයෝජනය වැඩි වේ. ආයෝජනය වැඩිවන විට ප්‍රාග්ධනය වැඩිවේ.




## ප්‍රශ්න අංක 14

පහත රූප සටහන් වලින් දැක්වෙන්නේ දේශීය හා විදේශීය ව්‍යවසායකයින් දෙදෙනෙකි.



බිල් ගේට්ස්



වික්ටර් හෙට්ටිගොඩ


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

**නිපුණතාවය 1.3 : නිෂ්පාදන සාධක වල ලක්ෂණ හඳුනා ගනිමින් නිෂ්පාදන සම්පත් වල ඵලදායීතාවය තීරණය කරන සාධක විග්‍රහ කරයි.**

ව්‍යවසායකයින් වශයෙන් මෙම පුද්ගලයින් විසින් සිදුකර ඇති කාර්යය පිළිබඳව ඔබේ අදහස් දක්වන්න.

පිළිතුර :-

බිල් ගේට්ස් :-

මයික්‍රොසොෆ්ට් පරිගණක මෘදුකාංග නිශ්පාදන ආයතනයේ හිමිකරුය. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය යන නිෂ්පාදන සාධක මනා ලෙස සංයෝග කරමින් නව පරිගණක මෘදුකාංගයක් වන මයික්‍රොසොෆ්ට් ලොවට හඳුන්වා දුන්නේ ඔහුය.

වික්ටර් හෙට්ටිගොඩ :-

මොහු භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය යන නිෂ්පාදන සාධක මනා ලෙස සංයෝග කරමින් නව වේදනා නාශක ආලේපයක් වන සිද්ධාලේප හඳුන්වා දී ඇත.

## ප්‍රශ්න අංක 15

නිෂ්පාදන සාධකයක් වශයෙන් ව්‍යවසායකත්වය යනුවෙන් කුමක් අදහස් වේද?

පිළිතුර :-

අවධානම් දරමින්, ප්‍රතිපත්තිමය තීරණ ගැනීමත්, නිෂ්පාදන කටයුතු සංවිධානය හා මෙහෙයවීමේ ක්‍රියාවලියක් ව්‍යවසායකත්වය නමින් හැඳින්වේ.

## ප්‍රශ්න අංක 16

ව්‍යවසායකත්වයේ ප්‍රධාන කාර්යභාරයයන් කවරේද?

පිළිතුර :-

- ✓ නිශ්පාදන කටයුතු සංවිධානය කිරීම.
- ✓ නිශ්පාදන කටයුතු සම්බන්ධ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම.
- ✓ නවයතාවයන් හඳුන්වා දීම.
- ✓ අවදානම් දැරීම.


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

**නිපුණතාවය 1.3 : නිෂ්පාදන සාධක වල ලක්ෂණ හඳුනා ගනිමින් නිෂ්පාදන සම්පත් වල ඵලදායීතාවය තීරණය කරන සාධක විග්‍රහ කරයි.**

## ප්‍රශ්න අංක 17

ව්‍යවසායකයෙකු සතුවිය යුතු ප්‍රධාන කාර්යභාරයයන් කවරේද?

පිළිතුර :-


- ✓ මානව සාධකයක් වීම
- ✓ ආරම්භක ශක්තිය
- ✓ අභියෝග වලට සාර්ථකව මුහුනදීමේ හැකියාව
- ✓ අනාගත දැක්ම
- ✓ ආත්ම විශ්වාසය
- ✓ පුහුණු කළ හැකි වීම

## ප්‍රශ්න අංක 18

උළු කර්මාන්ත ශාලාවක් හා සම්බන්ධ තොරතුරු පහත රූප සටහනෙහි දැක්වේ.



ශ්‍රමිකයන් 100



උළු කර්මාන්ත ශාලාව



දිනක නිශ්පාදනය උළු කැට 100

රූප සටහනේ දැක්වෙන පරිදි එක් ශ්‍රමිකයෙකුගේ දිනක උළු කැට නිෂ්පාදනය කොපමණද?

පිළිතුර :-

උළු කැට 200 කි.



The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

**නිපුණතාවය 1.3 : නිෂ්පාදන සාධක වල ලක්ෂණ හඳුනා ගනිමින් නිෂ්පාදන සම්පත් වල ඵලදායීතාවය තීරණය කරන සාධක විග්‍රහ කරයි.**

## ප්‍රශ්න අංක 19

ඉහත නිදසුන ද සැලකිල්ලට ගනිමින්, ඵලදායිතාවය යන්නෙන් අදහස් වන්නේ කුමක් දැයි පැහැදිලි කරන්න.

පිළිතුර :-

යෙදවුම් වලට ලැබෙන සාමාන්‍යය නිමැවුම් ප්‍රමාණය ඵලදායිතාවය නමින් හැඳින්වේ. නිමැවුම් ප්‍රමාණය යෙදවුම් ප්‍රමාණයෙන් බෙදීමෙන් ඵලදායීතාව ලබා ගත හැකිය.

$$\text{ඵලදායීතාව} = \frac{\text{නිමැවුම් ප්‍රමාණය}}{\text{යෙදවුමු ප්‍රමාණය}}$$

මෙහි දී යෙදවුම් සේ සලකන්නේ භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය යන සියළුම සාධකයන්ය.
ඒ අනුව නිමැවුම් යෙදවුම් වලින් බෙදීමෙන් ලැබෙන්නේ සමස්ත ඵලදායිතාවයයි.
මීට අමතරව ඒ ඒ සාධක සඳහා ඵලදායිතාව වෙන් වෙන් වශයෙන් ද ගණනය කළ හැකිය.

$$\text{ශ්‍රම ඵලදායීතාව} = \frac{\text{නිමැවුම් ප්‍රමාණය}}{\text{ශ්‍රම ඒකක ප්‍රමාණය}}$$

(ඉහත රූප සටහනෙහි දක්වා ඇත්තේ මෙම ශ්‍රම ඵලදායිතාවය පිළිබඳවයි.)

$$\text{භූමි ඵලදායිතාවය} = \frac{\text{නිමැවුම් ප්‍රමාණය}}{\text{භූමි ඒකක ප්‍රමාණය}}$$


Copyright © e-thaksalawa.moe.gov.lk

**නිපුණතාවය 1.3 : නිෂ්පාදන සාධක වල ලක්ෂණ හඳුනා ගනිමින් නිෂ්පාදන සම්පත් වල ඵලදායිතාවය තීරණය කරන සාධක විග්‍රහ කරයි.**

## ප්‍රශ්න අංක 20

නිෂ්පාදන සම්පත් වල ඵලදායිතාවය තීරණය කරන සාධක කවරේද?

පිළිතුර :-

- ✓ තාක්ෂණය
- ✓ මානව ප්‍රාග්ධනය
- ✓ කළමණාකරණය
- ✓ ශ්‍රම විභාජනය
- ✓ විශේෂීකරණය

මෙවැනි සාධක වල බලපෑම මත රටක ඵලදායිතාවය ඉහළ හෝ පහළ යයි.
නිදසුන් වශයෙන් තාක්ෂණය දියුණු වන විට ඵලදායිතාව ඉහළ යයි.
තාක්ෂණය නොදියුණු වන විට ඵලදායිතාවය පහළ යයි.

*****

අන්තර්ගතය - ඩබ්. ලයනල් - විසාකා විද්‍යාලය, බී.එස්. තිලකරත්න - ස්වර්ණමාලි බා.ම.වි, අයි.පී.එස්. පද්මිණී - ශාන්ත ජෝශප් බා.ම.වි.
සැකසුම -

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk